# ගිණුම්කරණය I

## 12 ශ්‍රේණිය

2018.03.26 **ද මැසනොද් විදුහල කඳාන** කාලය පැය 01

26 - 03 - 2018

Resource Centre
De Mazenod College
Kandana

නම ..................................................................................

පන්තිය ............................ පන්ති අංකය ............................

**01.** මූල්‍ය ප්‍රකාශනවල අරමුණු වන්නේ,

A. ව්‍යාපාරයේ මූල්‍ය තත්තව සන්නිවේදනය කිරීම.
B. ව්‍යාපාරයක ලාභ දායකත්වය සන්නිවේදනය කිරීම.
C. ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය වෙනස් වීම සන්නිවේදනය කිරීම.

1. A පමණයි. 3. B පමණයි 5. A, B හා C යන සියල්ල
2. A හා B පමණයි 4. B හා C පමණයි

**02.** පහත සඳහන් ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ හිමිකමට බලපාන ගනුදෙනු පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

A. අශාන් මුදලින් රු. 1,500,000 ක් යොදා ව්‍යාපාරයක් ඇරඹීම.
B. අශාන්ට පිය උරුමයෙන් ලද රු. 1,000,000 ක් වටිනා ගොඩනැගිල්ලක් ව්‍යාපාරයේ කටයුතු සඳහා යෙදවීම.
C. ව්‍යාපාරයේ කටයුතු සඳහා රු. 800,000 කට මොටර් රථයක් මිල දී ගැනීම.
D. ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස රු. 100,000 උපකරණ කමල්ගෙන් ණය ගැනීම.
E. නැවත විකිණීම සඳහා රු. 40,000 ක බඩු තොග අත්පිට මුදලට ගැනීම.

1. AB 2. ABC 3. ABCD 4. CDE 5. BC

**03.** පහත සඳහන් ගනුදෙනු අතරින් හිමිකම හා වත්කම අඩුවීමට බලපාන ගනුදෙනුව තෝරන්න.

1. බැංකුවෙන් රු. 200,000 ක ණයක් ගැනීම.
2. රු. 50,000 ක තොගයක් අත්පිට මුදලට ගැනීම.
3. අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 10,000 කි.
4. බැංකුවෙන් ගත් ණය මුදලින් රු. 30,000 ක් ගෙවීම.
5. රු. 40,000 ක භාණ්ඩ ණයට ගැනීම.

**04.** පහත සඳහන් ප්‍රකාශ අතරින් එකක් හැර අනෙක් ඒවා නිවැරදි වේ. වැරදි ප්‍රකාශය තෝරන්න.

1. අයිතිකරුවන් හැර වෙනත් පාර්ශවයන් බාහිර පාර්ශවය ව්‍යාපාර සම්පත් සඳහා දායක වී නොමැති විට ගිණුම්කරණ සමීකරණය වත්කම් = හිමිකම් වේ.
2. ව්‍යාපාරයකට එහි අයිතිකරුගෙන් හා ඔහුට අයත් වෙනත් ව්‍යාපාරවලිනුත් වෙන් වූ ස්වාධීන පැවැත්මක් ඇත.
3. මූල්‍ය මිනුම් සංකල්පයෙන් අදහස් වන්නේ මුදලින් අගය කළ හැකි සම්පත් පමණක් වාර්තාකරණ බවයි.
4. ව්‍යාපාරයක වත්කම් වෙනස්වන විට හිමිකම් අඩුවීමක් හෝ වැඩි වීමක් සිදු වේ.
5. ව්‍යාපාරයක වගකීම වෙනස් වීම වත්කම්වලින් මෙන්ම හිමිකමේ බලපෑමෙනුත් සිදු වේ.

05. පහත සඳහන් කුමන ප්‍රකාශ නිවැරදි වේද?

A. ව්‍යාපාර ඒකක සංකල්පය ගිණුම් තැබීමේ දී අදාල කර ගත යුතුය.

B. ව්‍යාපාරක් මඟින් අයිතිකරුගේ පෞද්ගලික වියදම් ගෙවිය යුතුය.

C. වත්කම් වෙනස් වන්නේ හිමිකමේ හෝ වගකීම්වල බලපෑමෙන් පමණි.

D. අයිතිකරුට මූලිකව යොදවන ප්‍රාග්ධනයට අමතරව පසුව ප්‍රාග්ධනය යෙදිය නොහැකිය.

E. අයිතිකරුවෙකුට ව්‍යාපාර කිහිපයක් ඇති විට එම සියල්ලම එකම ව්‍යාපාරයක් ලෙස සලකා ගිණුම් තැබීම සුදුසුයි.

1. A  2. A හා E  3. A,B හා C  4. B,C හා D  5. E පමණි.

06. ව්‍යාපාරික හිමිකම වෙනස් වීමට බලපාන ගනුදෙනු පමණක් ඇතුළත් පිළිතුර තෝරීම.

A. අයිතිකරු සතු රු. 400,000 ක ඉඩම් හා ගොඩනැගිල්ල ව්‍යාපාර කටයුතු සඳහා යෙදීම.

B. අයිතිකරුගේ නිවසේ දුරකථන බිල රු. 50,000 ක් ව්‍යාපාර මුදලින් ගෙවීම.

C. ව්‍යාපාරයේ විදුලි ගාස්තු රු. 150,000 ක් ගෙවීම.

E. ව්‍යාපාරයේ ස්ථිර තැන්පතුවක් සඳහා පොලිය වශයෙන් රු. 20,000 ක් ලැබීම.

1. ABDE  2. ABCD  3. ABCE  4. BCDE  5. ABC පමණි.

07. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. ආදායම් මඟින් ව්‍යාපාර හිමිකම වැඩි වේ.

B. අමතර ප්‍රාග්ධනය යෙදීමෙන් හිමිකම වෙනස් නොවේ.

C. ආදායම් ඉපයීමේ දී විවිධ වියදම් දැරීමට සිදු වේ.

D. බැංකු ණයක් ගැනීමෙන් හිමිකම පමණක් වැඩි වේ.

E. ගැනිලි සිදු කිරීම නිසා ව්‍යාපාරයේ වියදම් වැඩි වේ.

1. A,B,C  2. A හා C  3. A,C හා D  4. A,B හා E  5. A,B හා E

08. පහත කුමන ප්‍රකාශන ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි වේද?

1. සියලු ගැලපීම් සටහන් පොදු ජ'නලයේ සටහන් කරයි.

2. සියලු විකුණුම්, විකුණුම් ජ'නලයේ වාර්ථා කරයි.

3. භාණ්ඩ ණයට ගැනුම් හා බැදි සියලු සාරාංශගත තොරතුරු ණයහිමි පාලන ගිණුමේ සටහන් කරයි.

4. බැරපත ආයතනයේ ගණකාධිකරු විසින් පිළියෙල කරයි.

5. සියලු ආපසු යැවුම් ආපසු යැවුම් ජ'නලයේ සටහන් කරයි.

Grade - 12
26.03.2018
ලකුණු නිවැරදිව.

09. 2016.03.31 දින සීමිත සාලිය පොදු සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කරන ලදී. විමර්ශනයේ දී පහත කරුණු අනාවරණය විය.

* දුන් වට්ටම් රු. 15,000 ක් ලද වට්ටම් ලෙස ලද වට්ටම් ගිණුමට බැර කර තිබුණි.
* විකුණුම් ජනලය රු. 40,000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.
* රු. 10,000 ක ගැණුම් ඉන්වොසියක් ණයහිමි ලෙජරයට පිටපත් කර නොතිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය,

1. 80,000 හර 2. 20,000 බැර 3. 10,000 හර 4. 30,000 හර 5. 20,000 හර

10. ව්‍යාපාර ආයතනයකට පෙබරවාරි මාසයට අදාලව බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය වාසිදායක රු. 40,000 කි. බැංකුව අයකර ඇති බැංකු ගාස්තු රු. 10,000 ක් හා බැංකුවට කෙලින්ම බැර වී ඇති ආයෝජන ආදායම් රු. 20,000 ක් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් වී නැත. බැංකු ජංගම ගිණුමේ සියලු ගනුදෙනු ගැලපී ඇත.

අවශ්‍ය වන්නේ, සංශෝධිත ව්‍යාපාරයේ බැංකු ගිණුම් ශේෂය,

1. 50,000 2. 60,000 3. 30,000 4. 40,000 5. 20,000

Learning Resource Centre
De Mazenod College
Kandana

11. ව්‍යාපාර ආයතනයක 2016.12.31 ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 50,000 කි. එදින ණයගැති උපලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව හා සමාන නොවීය. පසුව පහත වැරදි සොයාගෙන ඇත.

* විකුණුම් ජනලය රු. 15,000 ක් අඩුවෙන් එකතු කර තිබීම.
* ආපසු එවුම් රු. 10,000 ක් ණයගැති පාලන ගිණුමට නිවැරදිව බැර කර ඇතත් උප ලෙජරයේ
* ණයගැතියාගේ පෞද්ගලික ගිණුමට බැර කර නොතිබීම.
* ණය ගැතියාගේ කපාහල රු. 5,000 ක පොල් ණය පිළිබඳව පොදු ලෙජරයේ හෝ ණයගැති උප ලෙජරයේ සටහනක් නැත.

<u>සංශෝධන ණයගැති පාලන ගිණුමේ ශේෂය හා ණයගැති උප ලෙජරයේ පවතින හර එකතුව වන්නේ,</u>

| සංශෝධිත ණයගැති පාලන ගිණුම | ණයගැති උපලෙජරයේ පවතින හර එකතුව |
|---|---|
| 1) 60,000 | 75,000 |
| 2) 55,000 | 70,000 |
| 3) 60,000 | 65,000 |
| 4) 70,000 | 50,000 |
| 5) 75,000 | 60,000 |

12 හා 13 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත තොරතුරු භාවිත කරන්න.

| | |
|---|---|
| විකිණීමට තිබූ බඩු තොගය | 150 000 |
| මුල තොගය | 20 000 |
| අග තොගය | ~~50 000~~ 30000 |

12. ගැනුම්වල වටිනාකම කීයද?

1. 150 000   2. 170 000   3. 120 000   4. 130 000   5. 100 000

13. විකුණුම් පිරිවැය කීයද?

1. 170 000   2. 120 000   3. 20 000   4. 130 000   5. 150 000

14. පහත කුමන ප්‍රකාශනය ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි වේද?

1. සියලු ගැණුම් ගැණුම් ජ'නලයේ වාර්ථා කරයි.
2. ශේෂ පිරික්සුම මූල්‍ය ප්‍රකාශනයකි.
3. ආපසු එවුම් ගිණුම ආදායම් ගිණුමකි.
4. සියලු මූලාශ්‍ර ලේඛන ගණකාධිකරු පිළියෙල කරයි.
5. ණයට විකුණූ භාණ්ඩ පිළිබඳ සියලු සාරාංශ ගත තොරතුරු ණයගැති පාලන ගිණුමේ සටහන් කරයි.

15. වගකීමක් යනු,

A අතීත ගනුදෙනුවක් හෝ සිදුවීමක් මත ඇති වී තිබෙන

B නිරාකරණය කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලාගෙන යන සම්භාවිතාවක් පවතින

C මුදලින් මැනිය හැකිය.

ඉහත නිවැරදි ප්‍රකාශන

1. A පමණයි   2. A හා B පමණයි   3. AB හා C
4. A හා C   5. B හා C

16. ගිණුම්කරණ මූලිකාංග වත්කම් වගකීම් හිමිකම් ආදායම් හා වියදම් වේ. පහත අයිතමයන් කුමන මූලිකාංගයකට අයත් වේද?

| | **අයිතමය** | **මූලිකාංගය** |
|---|---|---|
| 1 | වර්ෂයේ ලාභය | ........................ |
| 2 | ආපසු යැවුම් | ........................ |
| 3 | බඩු තොගය | ........................ |
| 4 | බැංකු ණය | ........................ |

17. පහත ගනුදෙනු වාර්තා කිරීමට අදාල මූලික ලියවිලි හා මූලික පොත නම් කරන්න.

| | **ගනුදෙනුව** | **මූලික ලියවිල්ල** | **මූලික පොත** |
|---|---|---|---|
| 1 | බැංකු ගාස්තු | ........................ | .................... |
| 2 | බොල් ණය | ........................ | .................... |
| 3 | මුදල් ගැනිලි | ........................ | .................... |
| 4 | බැංකු ණයක් ගැනීම | ........................ | .................... |

**18.** ආයතනයක මාස අග ණය හිමි පාලන ගිණුමේ ශේෂය බැර 35,000 ක් වඩින ණයහිමි උප ලෙජරයේ ශේෂය සමඟ මෙය සමාන නොවීය. පසුව පහත වැරදි සොයාගෙන ඇත.

1. ණයට ගැණුම් 50,000 ක් පාලන ගිණුමට 55,000 ක් ලෙස බැර කර තිබීම.
2. ණයහිමි ශේෂ ලැයිස්තුවේ බැර එකතුව 3,000 ක් අඩුවෙන් එකතු කර තිබීම.
3. ණය හිමියෙකුට රු. 4,000 ක භාණ්ඩ ආපසු යැවීම ණයහිමි පාලන ගිණුමේ හෝ උප ලෙජරයේ සටහන් කර නොතිබීම.

අවශ්‍ය වන්නේ,

සංශෝධිත ණය හිමි පාලන ගිණුමේ ශේෂය ...............................................................

(ආ) ණයහිමි උප ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව ...............................................

**19.** ආයතනයක සුළු මුදල් අග්‍රිමය රු 15,000 කි. පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| 12/31 සුළු මුදල් ඉතිරිය | 4000 |
| 01/31 සුළු මුදල් ඉතිරිය | 6000 |

අවශ්‍ය වන්නේ,

1. දෙසැම්බර් මාසයේ සුළු මුදල් ගෙවීම් කීයද? ..............................................

2. ජනවාරි මාසයේ සුළු මුදල් ගෙවීම් කීයද? ..............................................

**20.** රු 150,000 ක කාර්යාල උපකරණයක් ගැනීම මුදල් ගිණුමට නිවැරදිව බැර කර කාර්යාල වියදම් ගිණුමට රු. 105,000 ක් ලෙස හර කර ඇත.

ඉහත වැරැද්ද නිවැරදි කිරීමේ ජ්නල් සටහන දක්වන්න.

.............................................................................................

.............................................................................................

.............................................................................................

.............................................................................................

26.03.2018

21. පොදු ජනලය අනෙකුත් මූලික පොත්වලින් වෙනස් වීමට බලපාන කරුණු 2 ක් නම් කරන්න.

1 ...................................................................................................

2 ...................................................................................................

22. ආයතනයක VAT රහිත ණයට ගැණුම්වල වටිනාකම රු. 40,000 කි. එම ගැණුම්වලට ඇතුළත් කළ යුතු එකතු කළ අගය වන බදු (VAT) 10% පහත දැ පෙන්වන්න.

1. ගැණුම්වල වටිනාකම ..............................................

2. ලැබිය යුතු VAT ..............................................

3. වෙළඳ ගෙවිය යුතු දෑ (ණය හිමියා) ..............................................

Learning Resource Center
R
De Mazenod College
Kandana

23. 2017.02.28 දින ආයතනික බැංකු ගිණුම් ශේෂය අවාසිදායක රු. 20,000 කි. එදින බැංකු ප්‍රකාශන ශේෂය මේ හා සමාන නොවීය. වෙනසට හේතු පහත දැක්වේ.

අ) 1. ස්ථාවර නියෝග ගෙවීම් රු. 6,000 ක් පොත්වල සටහන් වී නැත.
2. නිකුත් කළ රු. 12,000 චෙක්පතක් බැංකුවට තවම ඉදිරිපත් වී නැත.

**අවශ්‍ය වන්නේ,**

1. 2.28 දින ව්‍යාපාරයේ නිවැරදි බැංකු ශේෂය ..............................................
2. 2.28 බැංකු ප්‍රකාශනයේ ශේෂය ..............................................

24. ආයතනයක් නැවතත් විකිණීම සඳහා රු. 50,000 ක් වටිනා බඩු තොගයක් ණයට ගෙන එම මුළු තොගයට රු. 75,000 කට අත්පිට විකුණා සැපයුම් කරුවන්ට ගෙවීමට ඇති සම්පූර්ණ මුදල 10% වෙළඳ වට්ටමකට යටත්ව ගෙවන ලදී. ඉහත ගනුදෙනුවල ශුද්ධ ප්‍රතිඵලය පහත සමීකරණ යටතේ දක්වන්න.

| **වත්කම්** | **= වගකීම්** | **+ හිමිකම** |
|---|---|---|
| .................... | .................... | .................... |

25. ආයතනයක මුළු විකුණුම් රු. 500,000 කි. එයින් 80% ණයට වේ. ආපසු එවුම් රු. 30,000 කි. දුන් වට්ටම් 10,000 යි. ණයගැතියන් ලද මුදල් රු. 220,000 කි. ඉහත ගනුදෙනුවල පහත වටිනාකම් සොයන්න.

1. විකුණුම් ..............................................

2. වියදම් ..............................................

3. ලද මුළු මුදල ..............................................

4. ණයගැති අග ශේෂය ..............................................

ද මැසනොද් විදුහල

ගිණුම්කරණය II

12 වසර

2018/3/26 කාලය පැය 2

2018.03.26

ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න. [සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.]

**01.** සමන් වෙළඳ ආයතනයේ 2017.03.31 න් අවසන් වර්ෂයට අදාල ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ප්‍රචාරණ ගාස්තු | 25,000 | |
| සේවක වේතනය | 48,000 | |
| මුදල් වංචා අලාභය | 5,000 | |
| ණය පොලී වියදම | 6,000 | |
| බොල් ණය | 10,000 | |
| විදුලි හා රක්ෂණ ගාස්තු | 8,000 | |
| සේවක වන්දිය | 7,000 | |
| අයිරා පොලිය | 3,000 | |
| වරිපනම් හා ලිපි ද්‍රව්‍ය ගාස්තු | 4,000 | |
| දුන් වට්ටම් | 2,000 | |
| ලද වට්ටම් | | 4,000 |
| ලද ගොඩනැගිලි කුලිය | | 28,000 |
| ලද ස්ථාවර තැන්පත් පොලිය | | 1,000 |
| ගැණුම් | 130,000 | |
| විකුණුම් | | 320,000 |
| ආපසු යැවුම් | | 10,000 |
| ආපසු එවුම් | 15,000 | |
| 2016.04.01 තොගය | 25,000 | |
| ගෙන වීමේ කුලිය | 13,000 | |
| ගොඩනැගිල්ල (පිරිවැය) | 400,000 | |
| ස්ථාවර තැන්පතුව | 100,000 | |
| දිගු කාලීන බැංකු ණය | | 80,000 |
| වෙළඳ ණය ගැතියෝ | 40,000 | |
| වෙළඳ ණය හිමියෝ | | 60,000 |
| මුදල් ඉතිරිය | 25,000 | |
| බැංකු අයිරාව | | 15,000 |
| ගැනිලි | 30,000 | |
| ප්‍රාග්ධනය | | 378,000 |
| | **896,000** | **896,000** |

**අමතර කරුණු,**

1. 2017.03.31 දිනට ඉතිරි තොගය රු. 38,000 කි.

**අවශ්‍ය වන්නේ,**

1. 2017.03.31 න් අවසන් වර්ෂයට ආදායම් ප්‍රකාශනය
2. 2017.03.31 දිනට මූල්‍යතත්ව ප්‍රකාශනය

(ලකුණු 10)

Learning Resource Centre
R
De Mazenod College
Kandana

**02.** අකිල 2017 මාර්තු 01 රු. 200,000 ක මුදලක් ද රු. 150,000 ක් වටිනා ලී බඩු යොදා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර පහත ගනුදෙනු පළමු මාසයේ ගිණුම්කරණ සමීකරණයක වර්ග කර ඇත.

| | ලී බඩු + | තොගය + | ණය ගැති + | මුදල් | + ණය හිමි | + ණය | + හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| 1 | +200,000 | | | +150,000 | | | +350,000 |
| 2 | | | | +80,000 | | +80,000 | |
| 3 | | +100,000 | | -100,000 | | | |
| 4 | | +80,000 | | | +80,000 | | |
| 5 | | -60,000 | | +90,000 | | | +30,000 |
| 6 | | -50,000 | +75,000 | | | | +25,000 |
| 7 | | | | -15,000 | | | -15,000 |
| 8 | | | | -45,000 | +50,000 | | +5,000 |
| 9 | | | -60,000 | +54,000 | | | -6,000 |
| 10 | | -7,000 | | | -7,000 | | |
| 11 | | -4,000 | | | | | -4,000 |
| 12 | | | | -12,000 | | -10,000 | -2,000 |
| | 20,000 | 590,000 | 15,000 | 202,000 | 23,000 | 70,000 | 483,000 |

**අමතර කරුණු**

1. මාසික ගොඩනැගිලි කුලිය ගෙවා ඇත.
2. අයිතිකරු බඩු තොගයේ කොටසක් ගැනිලි වශයෙන් ගෙන ඇත.

**අවශ්‍ය වන්නේ,**

1. ගනුදෙනු අංක 1 සිට 12 දක්වා ගනුදෙනු විටිනාකම සමග ලියා දැක්වීමයි.
2. ශුද්ධ වත්කම්වල වැඩි වීම හෝ අඩු වීම කීයද?
3. 2017.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු 10)

26-03-2018
Accounting
Grade - 12

**03.** කපිල ආයතනයේ ජනවාරි මාසයට අදාල බැංකුවෙන් ලැබුණු බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 3/1 | ශේෂය | | | 40,000 |
| 3/3 | චෙක් තැන්පතු (168) | | 25,000 | 65,000 |
| 3/5 | චෙක් නිකුතු (211) | 20,000 | | 45,000 |
| 3/9 | චෙක් තැන්පතු (521) | | 30,000 | 75,000 |
| 3/12 | චෙක් නිකුතු (212) | 38,000 | | 37,000 |
| 3/21 | චෙක් තැන්පතු (116) | | 15,000 | 52,000 |
| 3/25 | රක්ෂණ වාරිකය (ස්ථාවර) | 9,000 | | 43,000 |
| 3/29 | ලද ස්ථාවර තැන්පත් පොලිය | | 5,000 | 48,000 |
| 3/31 | චෙක්පොත් ගාස්තු | 1,000 | | 47,000 |

**අමතර කරුණු**

1. පසුගිය මාසයේ තැන්පත් කර ඇති නමුත් උපලබ්ධි නොවූ රු. 25,000 ක චෙක්පත හා නිකුත් කළ නමුත් ඉදිරිපත් වූ රු. 20,000 ක චෙක්පත බැංකු ප්‍රකාශනයේ සටහන් වී ඇත.

2. මාර්තු 24 තැන්පත් කළ රු. 22,000 ක චෙක්පත හා මාර්තු 28 නිකුත් කළ රු. 14,000 ක චෙක්පත බැංකු ප්‍රකාශනයේ සටහන් වී නැත.

3. සියලු බැංකු තැන්පත් කිරීම විකුණුම් පමණක් වන අතර චෙක් නිකුත් කර ඇත්තේ ගැනුම් සඳහා පමණි.

4. බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසු මුදල් ගිණුම සංශෝධනය කරයි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

**අවශ්‍ය වන්නේ,**

1. මාර්තු 01 බැංකු ප්‍රකාශනයේ ශේෂයෙන් ආරම්භ කර පෙබරවාරි මාසය සඳහා බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම.

2. මාර්තු මාසයේ සංශෝධනයට පෙර මුදල් ගිණුම පිළියෙල කිරීම.

3. මාර්තු 31 සංශෝධිත මුදල් ගිණුම පිළියෙල කිරීම.

4. ව්‍යාපාරයේ ශේෂයෙන් ආරම්භ කර මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම.

(ලකුණු10)

**04.** සහන් පවත්වාගෙන යන ආයතනයේ ණයගැතියන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ණයගැති නම | ජනවාරි 01 ශේෂය | ණයට විකුණුම් | ආපසු එවුම් | දුන් වට්ටම් | ලද මුදල් | බොල් ණය |
|---|---|---|---|---|---|---|
| අතුල | 15000 (හර) | 80,000 | 7,000 | 4,000 | 65,000 | |
| රුවන් | 20000 (හර) | 72,000 | 6,000 | 2,000 | 50,000 | |
| සාගර | 10000 (හර) | 60,000 | 4,000 | 1,000 | 40,000 | |
| පියල් | 8000 (බැර) | 50,000 | 3,000 | 3,000 | 30,000 | |
| තුෂාර | 4000 (බැර) | 40,000 | 2,000 | 5,000 | 24,000 | 5,000 |
| | | 302,000/- | 22,000/- | 15,000/- | 209,000/- | 5,000/- |

**අමතර කරුණු**

1. දුන් වට්ටම් තීරුවේ එකතුව ණයගැති පාලන ගිණුමට හර කර ඇත්තේ 5,000 ක් ලෙස

2. ණයට විකුණුම් ණයගැති පාලන ගිණුමට හර කර ඇත්තේ 203,000 ක් ලෙසය.

3. තුෂාරගෙන් කපාහල රු 5,000 බොල් ණය පිළිබඳ ණයගැති පාලන ගිණුමේ හෝ තුෂාරගේ පෞද්ගලික ගිණුමේ සටහනක් නැත.

4. අතුල ආපසු එවුම් රු.4,000 අතුලගේ පෞද්ගලික ගිණුමට ර.14,000 ක් ලෙස බැර කර තිබීම.

5. ණයගැති උප ලෙජරයේ ජනවාරි මස අග බැර ශේෂ නොතිබුණි.

**අවශ්‍ය වන්නේ,**

1. ජනවාරි මාසයේ සංශෝධනයට පෙර ණයගැති පාලන ගිණුම

2. සංශෝධිත ණයගැති පාලන ගිණුම

3. සංශෝධිත ණයගැති පාලන ගිණුමේ ශේෂයෙන් ආරම්භ කර ණයගැති සැසඳුම් ලේඛනය

4. ණයගැති උප ලෙජරයේ ජනවාරි 31 නිවැරදි ශේෂ ලැයිස්තුව (උප ලෙජරයේ ලෙජර් ගිණුම් පිළියෙල කිරීම අනවශ්‍යයි)

(ලකුණු 10)

**05.** ශක්ති සමාගමේ 2017.03.31 දින ශේෂ පිරික්සුම සමාන නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කරන ලදී. පසුව පහත වැරදි හඳුනාගෙන ඇත.

1. රු. 40,000 ක ගැණුම් ඉන්වොසියක් ගැණුම් ජ'නලයේ සටහන් නොවීමෙන් පොදු ලෙජරයේ ගැණුම් ගිණුමේ හා ණය හිමි පාලන ගිණුමේ සටහන් නොවීම.

2. රු. 50,000 ක විකුණුම් ඉන්වොසියක් විකුණුම් ජ'නලයේ නිවැරදිව සටහන් වී ඇතත් ණයගැති පාලන ගිණුමට නිවැරදිව හර කර විකුණුම් ගිණුමට බැර කර නොතිබීම.

3. රු. 5,900 ක විදුලි ගාස්තු ගෙවීම මුදල් ගෙවීම් ජ'නලයේ 9,500 ක් ලෙස සටහන් වීමෙන් මුදල් ගිණුමේ හා විදුලි ගාස්තු ගිණුමේ 9,500 ක් ලෙස සටහන් වීම.

4. ණය හිමියෙකුට රු.4,500 ක භාණ්ඩ ආපසු යැවුම් ණයහිමි පාලන ගිණුමට නිවැරදිව හර කර ඇතත් ආපසු යැවුම් ගිණුමට බැර කර ඇත්තේ රු.3,500 ක් ලෙසය.

5. ලද ගොඩනැගිලි කුලී රු.24,000 ක් මුදල් ලැබීම් ජ'නලයේ දෙපාරක් සටහන් වීමෙන් මුදල් ගිණුමේ හා ලද ගොඩනැගිලි කුලී ගිණුමේ දෙපාරක් සටහන් වීම.

6. සේවක වේතන ගෙවීම් රු.30,000 ක් මුදල් ගිණුමට නිවැරදිව බැර කර සේවක වේතන ගිණුමට ද බැර කර තිබීම.

7. ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමට ගෙවූ රු.12,000 මුදල් ගිණුමට නිවැරදිව බැර කර ගොඩනැගිලි ගිණුමට හර කර තිබීම.

8. කාර්යාල උපකරණ ගිණුමේ හර පැත්ත රු.10,000 ක් අඩුවෙන් එකතු කර තිබීම.

9. ප්‍රචාරණ ගාස්තු ගිණුමේ රු.18,000 ක ශේෂය ශේෂ පිරික්සුමේ සටහන් නොවීම.

**අවශ්‍ය වන්නේ,**

1. අවිනිශ්චිත ගිණුම පිළියෙල කර වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂය ලබා ගැනීම.

2. වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්

3. වැරදි නිවැරදි කිරීමට පෙර කෙටුම්පත් ලාභ අලාභ ගිණුමේ ලාභය රු.85,000 ක් නම් ලාභය නිවැරදි කිරීමේ ලේඛනය

4. 2017.03.01 ප්‍රාග්ධනය රු. 200,000 නම් මාර්තු 31 ශුද්ධ වත්කම් කීයද?

(ලකුණු 10)

06 පහත තොරතුරු PQR පෞද්ගලික ව්‍යාපාරයෙන් 2018 ජනවාරි මාසයට උපුටා ගන්නා ලදී.

## ගැණුම් ජ'නලය

| දිනය | ගැණුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| | අනිල් | 100,000 | 15,000 | 115,000 |
| | බැසිල් | 150,000 | 22,500 | 172,600 |
| | සිසිල් | 50,000 | - | 50,000 |
| | සුනිල් | 75,000 | 11,250 | 86,250 |
| | රනිල් | 15,000 | - | 15,000 |
| | | 390,000/- | 48,750/- | 438,750/- |

| දිනය | ගැණුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| | අමිල | 200,000 | 30,000 | 230,000 |
| | තරිඳු | 150,000 | 22,500 | 172,500 |
| | ලහිරු | 200,000 | - | 200,000 |
| | දිනරු | 30,000 | 4,500 | 34,500 |
| | සඳරු | 250,000 | 37,500 | 287,500 |
| | | 830,000/- | 94,500/- | 924,500/- |

## ආ/යැවුම් ජ'නලය

| දිනය | ගැණුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| | අනිල් | 10,000 | 1,500 | 11,500 |
| | බැසිල් | 20,000 | 3,000 | 23,000 |
| | සිසිල් | 5,000 | - | 5,000 |
| | රනිල් | 2,000 | - | 2,000 |
| | | 37,000/- | 4,500/- | 41,500/- |

## ආ/එවුම් ජ'නලය

| දිනය | ගැණුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| | අමිල | 20,000 | 3,000 | 23,000 |
| | ලහිරු | 10,000 | - | 10,000 |
| | දිනරු | 5,000 | 750 | 5,750 |
| | සඳරු | 3,000 | 450 | 3,450 |
| | | 38,000/- | 4,200/- | 42,200/- |

## මුදල් ලැබීමේ ජ'නලය

| දිනය | විස්තරය | චෙක්පත් අංක | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | විකුණුම් | ණය ගැති | ආදායම් |
| | විකුණුම් | - | - | 100,000 | 100,000 | | |
| | ණයගැති අමිල | 112401 | 10,000 | 240,000 | | 240,000 | |
| | පොලී ආදායම් | 134565 | - | 20,000 | | | 20,000 |
| | ණයගැති ලහිරු | 238542 | 5,000 | 25,000 | | 25,000 | |
| | විකුණුම් | - | - | 100,000 | 100,000 | 1 | |
| | කුලී ආදායම් | 112708 | - | 5,000 | | | 5,000 |
| | ණයගැති සඳරු | 131120 | 2,000 | 48,000 | | 48,000 | |
| | ණයගැති දිනරු | 112789 | 8,000 | 72,000 | | 72,000 | |
| | ලාභාංශ | 117832 | | 50,000 | | | 50,000 |
| | | | 25,000/- | 660,000/- | 200,000/- | 385,000/- | 75,000/- |

## මුදල් ගෙවීමේ ජ්නලය

| දිනය | විස්තරය | චෙකත් අංකය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ගැණුම් | ණය ගැති | ආදායම් |
| | ගැණුම් | 123789 | - | 50,000 | 50,000 | | |
| | ණයහිමි අනිල් | 123790 | 2,000 | 48,000 | | 48,000 | |
| | විදුලිය | 123791 | - | 10,000 | | | 10,000 |
| | ජලය | 123792 | | 5,000 | | | 5,000 |
| | ගැණුම් | 123793 | | 100,000 | 100,000 | | |
| | ණයහිමි බැසිල් | 123794 | 5,000 | 95,000 | | 95,000 | |
| | ණයහිමි සිසිල් | 1213795 | 2,000 | 18,000 | | 18,000 | |
| | ගැණුම් | 123796 | | 40,000 | 40,000 | | |
| | ණයහිමි රනිල් | 123797 | 1,000 | 12,000 | | 12,000 | |
| | | | 10,000/- | 378,000/- | 190,000/- | 173,000/- | 15,000/- |

## පොදු ජ්නලය

| දිනය | විස්තරය | හර | බැර |
|---|---|---|---|
| 01.01.2018 | ඉඩම් හා ගොඩනැගිලි | 300,000 | |
| | මෝටර් රථ | 200,000 | |
| | ණයගැති අමිල | 43,000 | |
| | " තරිඳු | 20,000 | |
| | " ලහිරු | 30,000 | |
| | " සඳරු | 10,000 | |
| | තොගය | 20,000 | |
| | බැංකු ශේෂය | | |
| | බැංකු ණය | | 200,000 |
| | ණයහිමි අනිල් | | 30,000 |
| | " බැසිල් | | 10,000 |
| | " සිසිල් | | 5,000 |
| | " සුනිල් | | 3,000 |
| | ප්‍රාග්ධනය | | 435,000 |
| | (ආරම්භක ශේෂ වාර්තා කිරීම) | | |
| | | 683,000/- | 683,000/- |
| 01.01.2018 | මෝටර් රථ හිණුම් හර | 500,000 | |
| | තරිඳු ට්‍රේඩර්ස් ණය | | 500,000 |
| | (තරිඳු ට්‍රේඩර්ස්ගෙන් රු. 50,000 මෝටර් රථයක් ණයට ගැනීම.) | | |

**අවශ්‍ය වන්නේ,**

1. 2018 ජනවාරි මාසයේ පොදු ලෙජරය (ඵලක ගිණුම සහිතව)
2. 2018.01.31 දිනට ශේෂ පිරික්සුම

(ලකුණු 10)